# පාස්කු සතියේ
# බ්‍රහස්පතින්දා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙන් ගත් පාඨයෙකි ක්‍රියා 3 : 11–26

ඔබ ජීවනයේ ස්වාමියාණන් මරා දැමූවාහු ය. දෙවියන් වහන්සේ එතුමන් උත්ථාන කළ සේක.

පේදුරු සහ ජුවාම් කොරව බවින් සුව වූ පුද්ගලයාගේ අතින් අල්ලාගෙන සලමොන්ගේ සක්මන් මළුවෙහි සිටිනු දුටු සමූහයා අතිශයින් පුදුම වී ඔවුන් වෙතට දිවූහ. පේදුරු ඒ සෙනඟට මෙසේ කීය. "ඉශ්රායෙල් ජනයෙනි, මේ ගැන ඔබ පුදුම වන්නේ කුමක් නිසා ද? අපේම බලයෙන් වත් යහපත්කමින් වත් අප මේ මිනිසා ඇවිදින්ට සැලසුවාක් මෙන් අප දෙස නෙත් යොමා මවිතයෙන් බලන්නේ මන්ද? ආබ්‍රහම්ගේ ද ඊසාක්ගේ ද ජාකොබ්ගේ ද දෙවි වූ අපගේ පියවරුන්ගේ දෙවියන් වහන්සේ තමුන් සේවකයා වූ ජේසුස් වහන්සේ මහිමයට පැමිණෙවූ සේක. එහෙත් ඔබ උන් වහන්සේ නඩු ශාලාවට පැමිණෙව්වාහු ය. තවද පිලාත් උන් වහන්සේ නිදහස් කරන්නට තීරණය කරගෙන සිටි විට ඔහු ඉදිරියේම ඔබ උන් වහන්සේ ප්‍රතික්ෂේප කළාහු ය. ඔබ සුවිශුද්ධ වූ ධර්මිෂ්ඨ වූ තැනැත් වහන්සේ ප්‍රතික්ෂේප කර ඒ වෙනුවට මිනීමරුවෙකු මුදා දෙන මෙන් ඉල්ලා සිටියාහු ය. මෙසේ ඔබ ජීවනේශ්වරයාණන් මරණයට පත්කළාහු ය. එහෙත් දෙවියන් වහන්සේ උන් වහන්සේ මරණයෙන් උත්ථාන කර වදාළ සේක. අප ඊට සාක්ෂිකාරයෝ වම්හ. දැන් ඔබ ඉදිරියේ සිටින ඔබ හඳුනන මේ මිනිසා සම්පූර්ණ සුවය ලැබුවේ උන් වහන්සේගේ නාමයෙන් හා ඒ නාමය කෙරෙහි ඇති ඇදහිල්ල කරණකොටගෙන ය."

"දැන් ඉතින් සහෝදරවරුනි, ඔබගේ ප්‍රධානීන් මෙන් ම, ඔබ ද නොදැනුම්කමින් ක්‍රියා කළ බව මම දනිමි. එසේ වුවත් ස්වකීය ක්‍රිස්තුස් වහන්සේ දුක් විඳිය යුතු යයි දෙවියන් වහන්සේ සියලු දිවැසිවරයන්ගේ මුවින් පෙර දන්වා වදාළ දේ මෙසේ සම්පූර්ණ කළ සේක. එබැවින් ඔබේ පව් මකාලන පිණිස ද දෙවියන් වහන්සේ

කෙරෙන් නව ජීවන යුගයක් පැමිණෙන පිණිස ද ඔබ උදෙසා පෙර නියම කරන ලද ක්‍රිස්තුස් නම් ජේසුස් වහන්සේ එවා වදාරණ පිණිස ද මනස්ථාපනය වී දෙවියන් වහන්සේ වෙතට හැරෙන්න. ආදි යුගවල සිට දෙවියන් වහන්සේ ස්වකීය ශුද්ධ දිවැසිවරයන්ගේ මුවින් දැන් වූ මුළු ලොවට නව ජීවනය දීමේ කාලය පැමිණෙන තුරු උන් වහන්සේ ස්වර්ගයේ වැඩ විසිය යුතුය. මන්ද ඔබගේ දෙවි ස්වාමින් වහන්සේ මා එවා වදාළාක් මෙන් ඔබේ සහෝදරයන් අතරෙන්ම දිවැසිවරයෙකු ඔබ හට එවා වදාරන සේක. ඔහු ඔබට වදාරන සියල්ලට ඔබ සවන් දිය යුතුය. ඒ දිවැසිවරයාට සවන් නොදෙන හැම කෙනෙක්ම සෙනඟ අතරෙන් සහමුලින්ම විනාශ කරනු ලැබෙති”යි මෝසෙස් කීය. නවද සාමුවෙල් පටන් පහළ වූ සියලු දිවැසිවරු ද එසේම පැවසූහ. මේ දවස් ගැනත් නිවේදනය කළහ. ඔබ වනාහි දිවැසිවරුන්ගේ ද “මේ වංශය කරණකොටගෙන හිමි පිට සියලු පවුල් ආශිර්වාද කරනු ලබන්නේ ය”යි දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට වදාරමින් ඔබේ පියවරුන් සමග කළ ගිවිසුමේ ද පුත්‍රයෝ වන්නාහු ය. දෙවියන් වහන්සේ ස්වකීය සේවකයාණන් උත්ථාන කොට පළමුවෙන්ම උන් වහන්සේ එවා වදාළේ ඔබ වෙතට ය. එසේ කළේ ඔබ හැම කෙනෙකුම තම තමාගේ අදමිටුකම්වලින් හරවා ආශිර්වාද කරනු පිණිස ය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 8 : 1, 4-8

පිළිතුර: දෙවිඳුනි, අපේ සමිඳුනි, ඔබේ නාමය ලෝ පුරා කොතරම් මහිමාන්විත ද?. ආලේලූයා //

ගීයː

දෙවිඳුනි, අපේ සමිඳුනි ඔබේ නාමය ලෝ පුරා කොතරම් මහිමාන්විත වන්නේද ? ඔබේ තේජෝ මහිමය සඟලොවින් එපිට පිළිරුවි දෙන්නේය.
මිනිසා ගැන සිතන්නට තරම් ඔහු කවරෙක්ද? මිනිසා ගැන සලකන්නට තරම් ඔහු සතු වටිනාකම කුමක් දැයි මට සිතෙන්නේය.

එහෙත් ඔබ මිනිසා මවා ඇත්තේ දෙවිඳුන්ට පමණක් දෙවැනි වන ලෙසින් ය. තෙද යස කිරුළක් ඔහු හිස පළඳන ලද්දේය. ඔබ මැවූ හැම දේ ඔහුට යටත් කළ සේක. ඔබ ඔහු මුළු සක්වලට අධිපති කළ සේක.

ගව බැටළු ආදී සතුන් ද වන සතුන් ද ඔහුට යටත් කළ සේක. ආකාශ පක්ෂීන් හා මුහුදු මසුන් ද සත් සමුදුර හැම සතුන් ද කෙරේ අධිපතිකම මිනිසා හට පවරා දුන් සේක.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
මෙන්න සමිඳුන්ගේ ජය මංගල දිනය! මෙදින අපි ප්‍රීති වෙමු. සන්තෝෂ වෙමු.
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ලූක් 24: 35–48

ක්‍රිස්තුස් වහන්සේ වද විඳින්නටත් තුන්වනදා මළවුන්ගෙන් නැගිටින්නටත් යුතුමැයි ලියා ඇත.

ශ්‍රාවකයන් මඟදී තමන්ට සිදුවූ කාරණා සහ පූප කැඩීමෙහි දී ස්වාමීන් වහන්සේ ඔවුන් ප්‍රකාශ වූ හැටි ද පවසමින් සිටිය දී උන් වහන්සේ ඔවුන් මැදට වැඩම කර "ඔබට ශාන්තිය වේවා"යි වදාළ සේක. එහෙත් ඔව්හු ත්‍රස්තව භීතියට පත්ව ඒ අවතාරයකැ යි සිතූහ. උන් වහන්සේ ඔවුන්ට කතා කොට "ඔබ කැළඹී සිටින්නේ මන්ද? ඔබගේ සිත්වල සැක උපදින්නේත් මන්ද? මාගේ අත් හා පා බලන්න. මේ මා ම බව තේරුම් ගන්න. මා ස්පර්ශ කොට බලන්න. ඔබට පෙනෙන ලෙස ඇට මස් සහිත සිරුරක් මට ඇත. අවතාරයකට නම් ඒවා නැතැ"යි වදාළ සේක. උන් වහන්සේ මෙවදන් කියා තම අත් හා පා ඔවුන්ට පෙන්වූ සේක. ඔවුන් ප්‍රීතිය නිසා විශ්වාස නොකොට පුදුම වෙමින් සිටිය දී උන් වහන්සේ මළවුන්ට කතා කොට "කෑමට යමක් මෙහි ඔබ වෙත තිබේ දැ"යි ඇසූ සේක. ඔව්හු බැදපු මාළු කැල්ලක් උන් වහන්සේට පිළිගැන්වූ හ. උන් වහන්සේ එය පිළිගෙන ඔවුන් ඉදිරිපිට දී වැළඳූ සේක. තවද උන් වහන්සේ කතා කරමින් "මා පිළිබඳ මෝසෙස්ගේ ව්‍යවස්ථාවලියෙහි ද දිවැසාවලියෙහි ද ගීතාවලියෙහි ද ලියා ඇති හැම දෙයම ඉෂ්ට විය යුතු යයි මා ඔබ සමඟ සිටිය දී ඔබට පැවසූ වචනයෙහි තේරුම මේ ය"යි වදාළ සේක. එවිට උන් වහන්සේ ශුද්ධ ලියවිල්ල ඔවුන්ට වැටහෙන පිණිස ඔවුන්ගේ සිත් පහදවා කතා කොට "මෙසේ ක්‍රිස්තුස් වහන්සේ වද විඳින්නටත් තුන්වනදා මළවුන්ගෙන් නැගිටින්නටත් ජෙරුසලමෙන් පටන් ගෙන සකල ලෝකවාසීන්ට මනස්ථාපනය ද පව් කමාව ද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කරනු ලබන්නට ද යුතු ම යයි ලියා ඇත. ඔබ මේ දේවල් වලට සාක්ෂිකාරයෝ වන්නා හු ය. බලන්න මම මාගේ පියාණන් වහන්සේගේ පෙරොත්තුව ඔබ වෙත ගෙනෙමි. එහෙත් ඉහළින් වන බලපරාක්‍රමයෙන් ඔබ හැම සන්නද්ධ කරනු ලබන තුරු නගරයෙහි නැවතී සිටින්නැ"යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.